263153

(17)

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1995 අංක 19 දරන
# උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1995 ඔක්තෝබර් මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1995 ඔක්තෝබර් මස 20 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල ශත 30 යි. තැපැල් ගාස්තුව : රු. 2.00 යි.

**1995 අංක 19 දරන උඩරට විවාහ සහ දික්කසාද (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1995 ඔක්තෝබර් මස 19 වන දින]

එල්. ඩී.—ඕ. 3/95

**උඩරට විවාහ සහ දික්කසාද ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1995 අංක 19 දරන උඩරට විවාහ සහ දික්කසාද (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු " ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) උඩරට විවාහ සහ දික්කසාද ආඥාපනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 113 වන අධිකාරයේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (1) විවාහය සිදුවන අවස්ථාවේ දී—

(අ) විවාහයේ පාර්ශ්වකරුවන් දෙදෙනාගෙන් එක් පාර්ශ්වකරුවකුගේ වයස විවාහවීමේ නීත්‍යානුකූල වයසට වඩා අඩු නම්; හෝ

(ආ) විවාහයේ පාර්ශ්වකරුවන් දෙදෙනාගේ ම වයස විවාහවීමේ නීත්‍යානුකූල වයසට වඩා අඩු නම්

මේ වගන්තිය බලාත්මක වීම ආරම්භවීමෙන් පසු සිදු කරන ලද කිසිම උඩරට විවාහයක් වලංගු නොවිය යුතුය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියේ "විවාහවීමේ නීත්‍යානුකූල වයස" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම.

"විවාහවීමේ නීත්‍යානුකූල වයස" යන්නෙන්. විවාහයේ පුරුෂ පාර්ශ්වය සහ ස්ත්‍රී පාර්ශ්වය සම්බන්ධයෙන් වන විට, අවුරුදු දහ අටක් වීම අදහස් වේ.".

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.